සුචරිතවත් දරු පරපුරක් - යහපත් සමාජයක්

# සාරධර්ම
## අත්පොත



අධ්‍යාපන අමාත්‍යාංශය

සාරධර්ම අත්පොත

අධ්‍යාපන අමාත්‍යාංශය

"සුචරිතවත් දරු පරපුරක් - යහපත් සමාජයක්" යන තේමාව ප්‍රමුඛ කොට ගත් මෙම සාරධර්ම සංග්‍රහය මගින් උපන් මහපොළවට ආදරය කරන පරිසරය සුරකින මනුදම් ගරුකරන අනාගත පරපුරක් දැයට දායාද කිරීම අපේක්ෂාවයි

ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

# "සුචරිතවත් දරු පරපුරක් යහපත් සමාජයක්"

පාසල් සාරධර්ම අත්පොත

(පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි සාරධර්ම සංග්‍රහය)

**<u>ප්‍රකාශනය</u>**

**ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

අද ළමා පරපුර හෙට රටේ භාරකරුවන් ය. එබැවින් ළමා පරපුර විනයගරුක, එඩිතර, කාර්යශූර, කලට වේලාවට වැඩ කරන මනා පෞරුෂයකින් හෙබි, නිරෝගී පිරිසක් බවට පත් කිරීම දෙමාපියන්ගේ, පාසලේ මෙන්ම සමස්ත සමාජයෙත් වගකීමකි.

උපන්දා සිට පාසලට ඇතුළත් වන අවස්ථාව දක්වා අපගේ පූර්වාචාර්යවරුන් වනුයේ දෙමාපියන් ය. දරුවෙකුගේ කායික වර්ධනය මෙන්ම මානසික, බුද්ධිමය, සමාජයීය සහ චිත්තවේගික සංවර්ධනයන්හි විශාල කාර්යභාරයක්, මඟපෙන්වීමක් දෙමාපියන් විසින් ඉටුකරනු ලබයි.

පාසලට ඇතුළත් වීමෙන් අනතුරුව මෙම කාර්යභාරය ගුරුවරයා විසින් ඉටු කරනු ලබයි. දෙමාපිය කාර්යභාරයේ යම් ඌනතාවක් සිදුව ඇත්නම් එයට පිළියම් යොදමින් දරුවාට මඟපෙන්වීමට ගුරුවරයාට සිදු වේ. අප සංස්කෘතියේ වටිනාකම් විනාශ නොවන අයුරින් දරුවාට හර පද්ධතීන් පවරාදීමේ මාහැඟි කර්තව්‍යයේ දී දරුවාට සම්බන්ධවන සියලු අංශයන්හි යහපත් මඟපෙන්වීම පාසලේ ගුරුවරයාගේ වගකීමකි. අත්නොහැරිය හැකි යුතුකමකි.

එසේම සීඝ්‍රයෙන් යහගුණ පරිහානිය කරා යන වත්මන් සමාජය තුළ දූෂණය, අපචාර, නොපනත්කම් හිස ඔසවා කුඩා දරුවන් බිල්ලට ගන්නා අවධියක සදාචාරාත්මක හැසිරීම් රටාවක වටිනාකම සමස්ත සමාජයට අවබෝධ කර දී ගුණගරුක මානව පිරිසක් දැයට දායාද කිරීම අධ්‍යාපනයේ මූලික අවශ්‍යතාවක් වී ඇත.

මෙම අනුපමේය කාර්යයේ දී සෑම දරුවෙකුටම අසාධාරණයක් නොවන පරිදි පිරිපුන් පුද්ගල චර්යාවන් ගොඩනැගීමට මඟ පෙන්වීම සඳහා "සුචරිතවත් දරු පරපුරක් යහපත් සමාජයක්" පොත සකසා ඇත.

මෙම පොතෙහි සඳහන් ක්‍රියාකාරකම් තුළින් අපේක්ෂිත ආකාරයට පාසල් පරිශ්‍රය, පන්ති කාමරය, ගුරු සිසු චර්යාව සැකසීමට හඳුන්වා දී ඇති කමිටු ඉතා කඩිනමින් ස්ථාපනය කරමින් සමස්ත පාසල් ප්‍රජාවේ සහය මෙම වැඩසටහන සඳහා ලබා ගැනීමට කටයුතු කරන ලෙස සියලු විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් වෙත දැනුම් දීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙම වටිනා ප්‍රයත්නය ගුණ නැණ බෙලෙන් යුතු පිරිපුන් දරුවෙකු සමාජගත කිරීමට මඟ පෙන්වන්නක් බවට පත් වී සුචරිතවත් සමාජයක් බිහි වේවා! යන්න මගේ ඒකායන ප්‍රාර්ථනය යි.

**මහාචාර්ය ජී. එල්. පීරිස්**
**අධ්‍යාපන අමාත්‍ය**

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවුඩය

පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතාගරු
එක පුන්සඳින් දුරුවෙයි ලොව ගණ අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය දුරු

ගුණ නැණ බෙලෙන් යුතු දරුවාගේ අගය මෙම කාව්‍ය තුළින් මනාව පෙන්නුම් කර ඇත. අතීතයේ දරුවන් සහ වර්තමානයේ දරුවන් සලකන කළ අතීතයේ දරුවා තුළ ගොඩනැගී තිබුණු සාරධර්ම, වර්තමානයේ දරුවාගෙන් අනුක්‍රමයෙන් ඈත් වූ බවක් විද්‍යමාන වෙයි.

තාක්ෂණික හා විද්‍යාත්මක දියුණුවත් සමග බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීමට වර්තමානයේ දරුවා දක්ෂ ය. එනමුදු සදාචාරවත් සමාජයකට ඔබින ගුණ දහම් ඔහු තුළ දක්නට නොමැත. තරගකාරී ලෙස එකිනෙකා පරයමින් ජයග්‍රහණය ලැබීමට උත්සාහ කරන නමුදු ජය පරාජය හමුවේ ඉවසීමට, ගැටලු අවස්ථාවන්ට සාර්ථකව මුහුණදීමට, සමාජය තුළ සහජීවනයෙන් කටයුතු කිරීමට ශක්තියක් ඔහුට නොමැත.

අද දරුවන්ගේ ලෝකය දරුවාට අහිමිවී ඇත. ඔහු ඇය හිමිදිරියේ අවදි වූ මොහොතේ සිට නින්දට යනතෙක් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් ජය ගැනීමට ක්‍රියාකරවමින් දෙමාපියෝ නොනවතින තරගයක යෙදී සිටිති. මේ තුළ දරුවා ළදරුවියේ දී හා ළමාවියේ දී පාරිසරික වශයෙන් සාමාජීය වශයෙන් අත්විඳිය යුතු සොඳුරු කුසලතාවන්, මිහිරි අත්දැකීම් තුළින් ගොඩනැගෙන යහපත් ආකල්ප සාධනයට විවර වූ මාර්ගයන් අවහිර කර දමා ඇත.

මෙවන් පසුබිමක දරුවන්ගේ සාරධර්ම ප්‍රවර්ධනය සඳහා දෙමාපියන්ට අමතරව විදුහල්පතිවරුන් සහ ගුරුභවතුන් මුල් වී ක්‍රියාත්මක කිරීමට සම්පාදනය කර ඇති මෙම වැඩසටහන ඉතාම කාලෝචිත බව ප්‍රකාශ කරමි. සාරධර්ම සංවර්ධනයට වැඩි අවධානයක් යොමුකර යහපත් සමාජයක් ගොඩනැගීමට දායකවීම මෙම ප්‍රයත්නයේ අභිප්‍රාය යි.

එබැවින් සියලු විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් දරුවාගේ සාරධර්ම සංවර්ධනය ඉලක්ක කරගනිමින් උපරිම ශක්ති ප්‍රමාණයෙන් මෙම යහපත් කර්තව්‍යය සාර්ථක කරගනු උදෙසා කටයුතු කරනු ඇතැයි ඉතසිතින් අපේක්ෂා කරමි.

**මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා**
**අධ්‍යාපන ලේකම්**

# **සාරධර්ම මෙහෙයුම් කමිටුව**

**උපදේශනය**

**අතිපූජ්‍ය**
**ඕමාරේ කස්සප ජ්‍යේෂ්ඨ අනුනායක මාහිමිපාණන් වහන්සේ**

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා මහතා.
අධ්‍යාපන ලේකම්.

එච්. යු. ප්‍රේමතිලක මහතා.
අතිරේක ලේකම්, (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන).

**මෙහෙයවීම**

එස්. බී. එම්. නිමල් ධර්මසිරි මහතා,
අධ්‍යාපන අධ්‍යක්ෂ,
ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව.

**සම්බන්ධීකරණය හා සංස්කරණය**

අයි. එම්. ඩබ්. ප්‍රනාන්දු පියතුමා,
නියෝජ්‍ය අධ්‍යපන අධ්‍යක්ෂ, (කතෝලික).

එම්. මුරලිදරන් මහතා,
අධ්‍යපන අධ්‍යක්ෂ, (හින්දු).

Z. තාජුඩීන් මහතා,
අධ්‍යපන අධ්‍යක්ෂ, (ඉස්ලාම්).

ඩී. පී. එස්. එම්. කුමාරි මහත්මිය,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික).

ඒ. එම්. ඩී. යූ. කේ. අමරසිංහ මහත්මිය,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ.

එල්. නිලන්ති ද සිල්වා මහත්මිය,
ශ්‍රී ලංකා ගුරු සේවය, (ක්‍රිස්තියානි).

**පූර්ව සම්බන්ධීකරණය**

ජීවා කළුආරච්චි මහත්මිය,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

එන්. කේ. ජී. ඩී. එල්. නානායක්කාර,
සංවර්ධන නිලධාරී.

**සම්පත්දායක මණ්ඩලය**

එස්. බී. එම්. නිමල් ධර්මසිරි මහතා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ඩී. ජී. එස්. එම්. කුමාරි මහත්මිය,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික).

ඒ. එම්. ඩී. යූ. කේ. අමරසිංහ මහත්මිය,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජීවා කළුආරච්චි මහත්මිය,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

**බාහිර සම්පත්දායකයින්**

පූජ්‍ය උඩුගම සුදස්සී ස්වාමීන් වහන්සේ,

ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

එල්. එන්. ඒ. වීරසිංහ මහතා,
ගුරු උපදේශක.

**විවිධ සහය**

පූජ්‍ය මොරපිටියේ කස්සප හිමි,
සංවර්ධන නිලධාරී.

පූජ්‍ය කොට්ටපිටියේ සීලවංශ හිමි,
සංවර්ධන නිලධාරී.

පූජ්‍ය තණබද්දේගම සෝභිත හිමි,
සංවර්ධන නිලධාරී.

සුසන්ත ලියනගේ මහතා,
සංවර්ධන නිලධාරී.

එන්. කේ. ජී. ඩී. එල්. නානායක්කාර මහතා,
සංවර්ධන නිලධාරී.

ඩී. ජී. ආර්. විජේලතා මහත්මිය,
සංවර්ධන නිලධාරී.

රුවන්දිමා දන්ගම්පල මහත්මිය,
සංවර්ධන නිලධාරී.

පී. ජී. එන්. මල්කාන්ති මහත්මිය,
තොරතුරු තාක්ෂණ සේවය.

ඩබ්. සී. කේ. යූ. ගාමිණී මහත්මිය,
රාජ්‍ය කළමනාකරණ සහකාර.

බී. වී. ටී. කේ. මුදලිහෙට්ටි මහත්මිය,
රාජ්‍ය කළමනාකරණ සහකාර.

චාමර ලක්මාල් පියදාස මහතා.

**සෝදුපත් කියවීම**

එස්. සුන්දරලිංගම් මහතා (දෙමළ මාධ්‍ය),
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

**පරිගණක වදන් සැකසුම**

ජී. ආර්. එම්. ඒ ගම්ලත් මහතා,
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**පිටකවර නිර්මාණය**

අයි. සමිත පෙරේරා මහතා

**ඇතුළත චිත්‍ර**

ඊ. එම්. කේ. රෝෂාන් චතුරංග
ගා/ කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය

**පරිගණක වදන් සැකසුම**

කේ. එන්. පී. පුෂ්ප කුමාර මහතා,
උපාලි සමූහ ව්‍යාපාරය,
හෝමාගම.

ජ'පුර ප්‍රින්ටර්ස්,
57/A ශ්‍රී සෝරත මාවත,
ගංගොඩවිල, නුගේගොඩ.

# පටුන


පිටු අංක

- ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය iii
- අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවුඩය V
- සාරධර්ම මෙහයුම් කමිටුව V-Viii
- පාසල් සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් මූලික තොරතුරු

i. හැඳින්වීම 1

ii. වැඩසටහනෙහි දැක්ම 1

iii. පාසල් සාරධර්ම වැඩසටහනෙහි අපේක්ෂිත අරමුණු 2

iv. පාසල් සාරධර්ම ප්‍රවර්ධනයේ කාලීන අවශ්‍යතාව 2

v. සාරධර්ම සංවර්ධනය කෙරෙහි ප්‍රබලව දායක වියහැකි පාර්ශ්වයන් 3

01. සාරධර්ම

1.1. සාරධර්ම යනු කුමක්ද? 3

1.2. සාරධර්ම පිරිහීම හේතුවෙන් වර්තමාන පාසල් පද්ධතිය තුළ දක්නට ලැබෙන ගැටලු. 4

1.3. සාරධර්ම පිරිහීමේ ගැටලු විසඳීම සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා. 4

02. පාසල් සාරධර්ම වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා යෝජිත ක්‍රියා පිළිවෙළ

2.1 පාසල හා ප්‍රජාව දැනුවත් කිරීම (අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන් ගුරුභවතුන්, පාසල් සිසුන් හා පාසල් ප්‍රජාව) 5
2.2 පාසල් පිරියත සකස් කිරීම. 6-12
2.3 සාරධර්ම ක්‍රියාකාරී කමිටු පිහිටුවීම. 12-17
2.4 පාසල් සාරධර්ම වැඩසටහනෙහි ක්‍රියාකාරකම්. 18-22

**3.0 දෙමාපිය දැනුවත් කිරීම සඳහා ගුරුවරයාගේ මගපෙන්වීම**

3.1 දැනුවත් කිරීම හා සංවිධාන කටයුතු. 23
3.2 දෙමාපියන් දරුවන්ගේ සාරධර්ම ප්‍රවර්ධනය උදෙසා නිවස තුළ දී කටයුතු කළ යුත්තේ කෙසේද? 23
3.3 දරුවන්ගේ ආරක්ෂාව පිණිස කටයුතු කළ යුත්තේ කෙසේද?

23-24
3.4 නිවස තුළ ඉගෙනුම් පරිසරයක් ඇති වන සේ කටයුතු කළ යුතු ආකාරය. 24-25
3.5 සමාජ සංහිඳියාව වර්ධනය වන අයුරින් කටයුතු කිරීමේ පිළිවෙත.

25

**4.0 නියාමන ආකෘති පත්‍ර** 26-27

**5.0 නියාමන ආකෘති පත්‍ර**

**විදුහල්පති, ගුරුමණ්ඩලය හා කාර්ය මණ්ඩලය ඇගයීම.** 28-29

**6.0 නියාමන ආකෘති පත්‍ර**

ශිෂ්‍ය සාරධර්ම ඇගයීම් 30-33

## “ සුචරිතවත් දරු පරපුරක් - යහපත් සමාජයක් ”

i. හැඳින්වීම

ii. වැඩසටහනෙහි දැක්ම

iii. පාසල් සාරධර්ම වැඩසටහනෙහි අරමුණු

iv. පාසල් සාරධර්ම ප්‍රවර්ධනයේ කාලීන අවශ්‍යතාව

v. පාසල් සාරධර්ම ප්‍රවර්ධනය සඳහා සෘජු දායකත්වයක් දැක් වූ පාර්ශ්වයන්

## i. හැඳින්වීම

පාසල් සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය එක්ව සමස්ත පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට අදාළව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහනකි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යාපන පරිපාලන නිලධාරීන් විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් සහ ශිෂ්‍යයින් යන සියලුම පාර්ශ්වයන් එක්ව සහයෝගීතාවෙන් යුක්තව දෛනිකව ක්‍රියාවට නැගිය යුත්තකි. මෙම වැඩසටහන ***කාලීන අවශ්‍යතාවක්*** නිසා වගකීම හා වගවීම ඒ ඒ පාර්ශව විසින්ම අපේක්ෂා කරනු ලැබේ.

මෙම වැඩසටහන මගින් පාසල් විනය මෙන්ම පුද්ගල චරිත තුළ යහගුණධර්ම, පෞරුෂය, චිත්තවේග බුද්ධිය හා මෘදු කුසලතා සංවර්ධනය කිරීම හා අනාගත සමාජයේ යහපැවැත්ම අපේක්ෂා කරනු ලබයි.

## ii. වැඩසටහනෙහි දැක්ම

“සුචරිතවත් දරු පරපුරක් යහපත් සමාජයක් ”


## iii. පාසල් සාරධර්ම වැඩසටහනේ අපේක්ෂිත අරමුණු

1. සුචරිතවත් ජීවිතයක් සඳහා පුද්ගල චරිත සංවර්ධනය කිරීම.
2. දේශීය සංස්කෘතියෙහි වටිනාකම් හඳුනාගනිමින් සුරක්ෂිතව මතුපරපුරට දායාද කිරීම.
3. සහජීවනයෙන් යුත් යහපත් සමාජයක් තුළින් සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම.
4. ආත්ම ශක්තිය හා සැනසිලිදායක ජීවිතයක් ගොඩනැගීම.
5. පරිසර හිතකාමී යහ ආකල්ප සංවර්ධනය කිරීම.

## iv. පාසල් සාරධර්ම ප්‍රවර්ධනයේ කාලීන අවශ්‍යතාව

1. දැනුම මූලික කරගත් අධ්‍යාපනය තුළින් සමාජ ගුණධර්ම සංවර්ධනයට ඇති අවස්ථා සීමාසහිත වීම නිසා සාරධර්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට පාසල මගින් බලගැන්වීම.
2. යහපත් සාරධර්මවලින් හෙබි අනගි සමාජ ජීවිතයක් ගත කිරීමට එකල ශ්‍රී ලාංකිකයන් සතුව තිබූ ගුණධර්ම බොහොමයක් සමාජයෙන් දුරස්වීම හේතුවෙන් ඒවායේ කාලීන වැදගත්කම අවධාරණය කිරීම.
3. පාසල් පද්ධතිය තුළ මෙන්ම සමාජ සංස්ථාව තුළ සාරධර්ම කඩවීම හේතුවෙන් ගැටලු රාශියක් උද්ගතව පැවතීම හේතුවෙන් එම ගැටලු විසදා ගැනීම පිණිස මග පෙන්වීම.
4. දෛනික ජීවන කටයුතුවලදී ආගමික පරිසරයෙන් දුරස්වී කටයුතු කිරීම නිසා මතුව පවතින සමාජ ව්‍යසනය මගහරවා ගැනීමට මග පෙන්වීම.

## V. සාරධර්ම සංවර්ධනයට ප්‍රබලව දායක විය හැකි පාර්ශ්වයන්




## 01. සාරධර්ම

1.1. සාරධර්ම යනු කුමක්ද ?

1.2. සාරධර්ම පිරිහීම හේතුවෙන් වර්තමාන පාසල් පද්ධතිය තුළ දක්නට ලැබෙන ගැටලු.

1.3. සාරධර්ම පිරිහීමේ ගැටලු විසඳීම සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා.

1.1. සාරධර්ම යනු කුමක්ද ?

සමාජය තුළදී පුද්ගල ජීවිතයට ඉතා ඉහළ වටිනාකමක් ලබාදීම උදෙසා සමාජය පිළිගත්, අවශ්‍ය සමාජමය වටිනාකම් හෙවත් මානව ගුණධර්ම පද්ධතිය සාරධර්ම ලෙස හැඳින් වේ.

1.2. සාරධර්ම පිරිහීම හේතුවෙන් වර්තමාන පාසල් පද්ධතිය තුළ දක්නට ලැබෙන ගැටලු

- පාසල් ශිෂ්‍යයන් මද්‍යසාර හා දුම් පානයට යොමුවීම හා එහි ප්‍රවණතාව සීඝ්‍රයෙන් ඉහළ යෑම.
- බටහිර අනුකරණයට වැඩි ප්‍රවණතාවක් දක්වීම.
- නවීන සන්නිවේදනය වැරදි ලෙස භාවිත කිරීම.
- විවිධ පාර්ශවයන් පාසල පිළිබඳව දක්වන ඍණාත්මක ආකල්ප.
- ශිෂ්‍යයා අධ්‍යාත්මික සංවර්ධනයෙන් ඈත්වීම.
- ශිෂ්‍යයන්ගේ කලහකාරී ප්‍රචණ්ඩ හැසිරීම හා අසභ්‍ය වාග් විලාශය.
- ශිෂ්‍යයන්ගේ මානසික ආතතිය ඉහළ යෑම.
- දෙමාපිය දූ-දරු හා ගුරු-සිසු සබඳතා දුරස්ව පැවතීම.
- සිසුන්ගේ අයහපත් චිත්තවේග පාලනය ඉතා පහළ අගයක් ගැනීම.

### 1.3. සාරධර්ම පිරිහීමේ ගැටලු විසඳීම සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා

- පාසල තුළ සෞන්දර්ය, සාහිත්‍ය රසාස්වාදය හා ක්‍රීඩාව ආදිය තුළින් විනෝදාශ්වාදය ඇති කරවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සිසුන් තුළ පවතින ආචාරධර්ම යාවත්කාලීන කර ක්‍රියාවට නැංවීම.
- සිසුන් තුළ ආගමික නැඹුරුව හා ආධ්‍යාත්මික ගුණාංග දියුණු කරවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පාසල තුළ උපදේශනය හා මාර්ගෝපදේශය බලගැන්වීම.
- සාධුචර්යා වැඩපොත් භාවිතය හා එය ඍජු නියාමනයට ලක්කිරීම.
- සිසුන් තුළ නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සිසුන් තුළ පවත්නා වූ මෘදු කුසලතා මෙන්ම නිපුණතා සංවර්ධනය කරන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## 02. පාසල් සාරධර්ම වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා යෝජිත ක්‍රියා පිළිවෙළ

2.1 පාසල හා ප්‍රජාව දැනුවත් කිරීම (අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, පාසල් සිසුන් හා පාසල් ප්‍රජාව)
2.2 පාසල් පිරියත සකස් කිරීම.
2.3 සාරධර්ම ක්‍රියාකාරී කමිටු පිහිටුවීම.
2.4 සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහනෙහි ක්‍රියාකාරකම්.

## 2.1 පාසල හා ප්‍රජාව දැනුවත් කිරීම.

පාසල් සාරධර්ම වැඩසටහන මැනවින් ක්‍රියාත්මක කිරීමට නම් සියලුදෙනාගේම කැපවීම හා දායකත්වය තිබිය යුතු බව අපගේ විස්වාසයයි. එහෙයින් පහත සඳහන් කණ්ඩායම් සාරධර්ම වැඩසටහන තම රාජකාරියේම කොටසක් ලෙස සලකා පාසල හා ප්‍රජාව දැනුවත් කිරීම් කරන්නේ නම් අනාගතයේ බලාපොරොත්තු වන "***සුචරිතවත් දරු පරපුරක් - යහපත් සමාජයක්*** "ගොඩනැගිය හැකියැයි අපි විශ්වාස කරමු.

- **දැනුවත් විය යුතු පාර්ශ්වයන්**

- අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්
- ජාතික අධ්‍යාපන ආයතනයේ සියලුම නිලධාරීන්
- පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා සියලුම නිලධාරීන්
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා සියලුම නිලධාරීන්
- කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා සියලුම නිලධාරීන්
- සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
- විදුහල්පතිවරුන්
- ගුරු උපදේශකවරුන්
- ගුරුවරුන්
- පාසල් ශිෂ්‍ය නායක නායිකාවන්
- පාසල් ශිෂ්‍යශිෂ්‍යාවන් හා පාසල් ප්‍රජාව.


සැ.යු. 2.1.1 දැනුවත් කිරීමේදී පිළිපැදිය යුතු කරුණු

පාසල් සාරධර්ම වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම කරනු ලබන සෑම නිලධාරියකු විසින්ම පහත සඳහන් මූලික කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර මෙම වැඩසටහනේ දැක්ම හා මෙහෙවර ද පැහැදිලි කර දිය යුතුය.

- පාසල් සාරධර්ම වැඩසටහන සියලුදෙනාගේම වගකීමක් හා වගවීමක් බව.
- වර්තමාන ගැටලු හමුවේ මෙම වැඩ පිළිවෙළ කාලීන අවශ්‍යතාවක් බව.
- මෙම කාර්යය ස්වකීය ප්‍රමුඛ කාර්යයක් සේ සළකා සත්භාවයෙන් ක්‍රියාවට නැංවීම.

- පාසල් පද්ධතිය තුළ ජීවන පුරුදු ලෙස අඛණ්ඩව ක්‍රියාවට නැංවිය යුතු බව.
- විෂයානුබද්ධව හා විෂය බාහිරව ක්‍රියාවට නැංවිය යුතු බව.
- පාසලේ දී සාරධර්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්වල සුදුසු පාර්ශවයන් සහභාගිකර ගැනීමෙන් එය සාර්ථක කරගත හැකි බව.
- සෑම අවස්ථාවකදීම නියාමනය හා ප්‍රගති සමාලෝචනය අවශ්‍ය බව.
- අවස්ථානුකූලව ඇගයීමට හා ප්‍රශංසාවට ලක්විය යුතු බව.

## 2.2 පාසල් පිරියත සකස් කිරීම




### 2.2.1 පාසල් භූමිය හා ක්‍රීඩා පිටිය

- දෛනිකව පිරිසිදු කිරීමේ කටයුතු සැලසුම් සහගතව ක්‍රමානුකූලව සිදුකිරීම.
- පරිසරය සංරක්ෂණය කිරීම.
- කාණු පද්ධතිය හොඳින් ජලය බැහැරවන සේ සැකසීම.
- පාසල්භූමිය වටා වැටක් හෝ තාප්පයක් ඉදිකිරීම හා හොඳින් වැසිය හැකි පරිදි ගේට්ටු සකසා ගැනීම.
- ක්‍රීඩාපිටිය සුදුසු පරිදි ආරක්ෂිතව සකසා ගැනීම.

- පිවිසුම් දොරටුව අසල හොඳින් පෙනෙන සේ පාසල් නාමපුවරුව ප්‍රදර්ශනය කිරීම.
- පාසලේ කොඩි කණු සුදුසු ස්ථානවල ස්ථානගතකර තැබීම හා නිවැරදි ලෙස කොඩි ඔසවා තැබීම.
- දෙමාපියන් සඳහා වූ දැන්වීම් පුවරුව පාසල් ප්‍රධාන පිවිසුම් දොරටුව අසල පැහැදිලිව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම. (පහසුවෙන් කියවිය හැකි ආකාරයට)
- පාසලේ ළිඳක් ඇත්නම් එය හොඳින් ඉස පිරිසිදු කර දැල් ආවරණයක් දමා වසා තැබීම, ළිඳට බොලොක්කයක්, නිශ්චිත බාල්දියක්, ලණුවක්, බාල්දිය රැඳවීමට ආධාරකයක් තැබීම, ළිඳ වටා ජලය බැස යාමට සුදුසු පරිදි සකසා තිබීම, මෝටරයක් මගින් ජලය ලබාගන්නේනම් ඒ සඳහා සුදුසු ස්ථානයක සුරක්ෂිතව මෝටරය ස්ථානගත කිරීම, ජලනල පද්ධතිය ජලය කාන්දු නොවන ලෙස සකසා තැබීම, ජලනල පද්ධතිය ආශ්‍රිත ජල කරාම හා ජල බේසම් පිරිසිදුව පවත්වා ගැනීම, ජලය ලබාගත් පසු කරාම හොඳින් වසා තැබීම.
- පාසලේ හඳුනාගත් අනාරක්ෂිත ස්ථාන, ළිං, වළවල්, දිරාගිය ගස්, අනාරක්ෂිත විදුලි රැහැන් හා දිරාගිය වහල ආදිය ඉවත් කිරීම.
- අභ්‍යන්තර මාර්ග පද්ධතිය ක්‍රමානුකූලව සකසා ඒ ඒ ස්ථානවල පිහිටීම දැක්වෙන පාසල් බිම් සැලැස්ම නාමපුවරු හා ගොඩනැගිලි ව්‍යුහය දැක්වෙන පුවරු ප්‍රදර්ශනය කිරීම. (පාසල් සිතියම නිවැරදිව ප්‍රදර්ශනය කිරීම)
- පහත දැක්වෙන ආකාරයට කසල බඳුන් වර්ගීකරණය කර යෝග්‍ය පරිදි ස්ථානගත කිරීම, කසල බඳුන් වසා තැබීම, කසල දෛනිකව බැහැර කිරීමේ ක්‍රමවේද සැකසීම, දිරායන කසල කොම්පෝස්ට් කර නැවත පාසල් භූමියේ විවිධ වගාවන්ට යොදා ගැනීම.(මල්, පළතුරු, එළවළු, ආදිය වැවීමට)
- විදුහල්පතිගේ හා ගුරු භවතුන්ගේ වාහන නවතා තැබීම සඳහා නිශ්චිත ස්ථානයක් වෙන්කර ගැනීම මෙන්ම පාසලේ අනෙකුත් රථවාහන සඳහා ගරාජයක් සැකසීම හෝ නිශ්චිත ස්ථානයක් වෙන්කර තැබීම.




රූපය 1

## 2.2.2 පාසල් ගොඩනැගිලි/පන්තිකාමර/විද්‍යාගාර/ ක්‍රීඩාගාර/ගණිතාගාර

- පන්ති කාමරයට ඇතුළුවන ස්ථානයේ පා පිස්නාවක් (බුමුතුරුණක්) තැබීම.
- ආගමික කටයුතු සඳහා පන්ති කාමරය ඉදිරිපස උස් ස්ථානයක ආගමික සංකේතයන් තබා පුද පූජා පැවැත්වීම.
- පොත්පත් හා ලිපි ලේඛන නිසි පරිදි ස්ථානගත කර තැබීම. (පන්ති වාර්තා පොත, ශිෂ්‍ය නාම ලේඛනය, ඇගයීම් වාර්තා, ඇගයීම් සැලසුම්, ක්‍රියාකාරකම් පත්‍රිකා, අමතර කියවීම් පොත් ආදිය)
- ඉගෙනුම් පුවරු හා ප්‍රදර්ශන පත්‍රිකා ආදිය සවි කිරීමේ දී බිත්තිවලට හානියක් නොවන සේ පිළිවෙළට නිවැරදිව ස්ථානගත කිරීම. (සියලු දරුවන්ට පෙනෙන සේ ප්‍රදර්ශනය කිරීම)
- පන්ති පුස්තකාලයක්, පොත් රාක්කයක් විධිමත්ව පවත්වාගෙන යාම.
- පන්ති කාමරය තුළ දින දර්ශනයක්, සුදුසු ලෙස ස්ථානගත කිරීම.
- පිරිසිදු කිරීමේ උපකරණ පන්ති කාමරයේ කෙළවරක නියමිත ස්ථානයක විධිමත්ව හා ක්‍රමානුකූලව තැබීම.
- නිශ්චිත ස්ථානයක කසල බඳුන් වර්ණ ගන්වා ස්ථානගත කර තැබීම.(රූපය 1හි පරිදි)

- ඩෙස්, පුටු හා බිත්ති ආදියේ නොගැළපෙන දෑ ඇඳීමෙන් හා ලිවීමෙන් වැළකීම.
- දිනය අවසානයේ පන්තියේ රැස්වෙන කැළිකසල නියමිත පරිදි බැහැර කිරීම.
- පන්ති කාමරයේ ගෙබිම සහ උපකරණවලට සිදුවන සුළු හානිවල දී ඒවා කඩිනමින් විධිමත් ක්‍රමවේදයකට අනුව ප්‍රතිසංස්කරණය කිරීම.
- විශේෂිත ඒකකවලට ඇතුළුවීමේදී පාවහන් ගලවා නිවැරදිව ස්ථාන ගත කර ඇතුළුවීම. (විද්‍යාගාර, ගෘහ විද්‍යාගාර, සෞන්දර්ය ඒකක, ආගමික ස්ථාන...)
- විද්‍යාගාර වැනි ස්ථානවලදී පරිහරණය කරන ලද උපකරණ පිරිසිදු කර පිළිවෙළට තැබීම.
- සෑම ස්ථානයක දී ම පොදු උපකරණවලට හානියක් නොවන ආකාරයට කටයුතු කිරීම.
- භාවිත කරන උපකරණ, පැවරුම්පත්, ඇගයීම් පත්‍රිකා ආදිය අවශ්‍ය අවස්ථාවලදී සිසුන් අතර හුවමාරු කර ගැනීම හා බෙදාහදාගෙන භාවිත කිරීම.
- පාසල් ගොඩනැගිලි බිත්ති ආදියෙහි තීන්ත ආලේප කිරීම හා ඒවායේ දරුවන්ගේ අධ්‍යාපනයට හා සාරධර්ම සංවර්ධනයට අදාළ උපදෙස් හා වැදගත් සංකල්ප ප්‍රදර්ශනය කිරීම. (චිත්‍ර, සිතුවම්, කවි)
- කාණු පද්ධතිය, ගොඩනැගිලි වහල පීළි, වැසිකිළි, කැසිකිළි ආදිය හොඳින් ජලය බැසයන ආකාරයට පවත්වාගෙන යාම හා එම ස්ථාන දෛනිකව සුදුසු පරිදි පිරිසිදු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
- පාසලේ ළමා උයන හා ක්‍රීඩා භූමිය, තාප්පය පිරිසිදුව හා ක්‍රමානුකූලව පවත්වා ගැනීම.
- කැඩී බිඳීගිය ගොඩනැගිලි හා ඉගෙනුම් උපකරණ පිළිසකර කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම හා පිළිසකර කළ නොහැකි දේ නිසි පරිදි බැහැර කරන තුරු ක්‍රමානුකූල ව ගබඩා කිරීමට කටයුතු කිරීම.
- පිහිනුම් තටාක, ගෘහස්ථ ක්‍රීඩාගාර, පරිගණක ඒකක ආදී සියල්ල කාලසටහන් සහිතව ක්‍රමානුකූලව, භාවිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සියලු ම ඒකක ඉබි යතුරු දමා සොරසතුරන්ගෙන් ආරක්ෂා කිරීම හා සතුන්ගේ පරිහරණයට අවකාශ නොලැබෙන සේ සකස් කරවීම.

## 2.2.3 ආගමික ස්ථානය

- ආගමික ස්ථානය ඉතා පිරිසිදුව ක්‍රමවත්ව ගෞරවාභිමානයෙන් යුක්තව පවත්වා ගැනීම.
- දෛනික වන්දනාමාන සඳහා ආගමික වතාවතක් සකස් කොට ඒ ඒ පන්තිවලට බෙදා දීම.
- පැවිදි උතුමන්ගේ මූලික මැදිහත්වීම මත හෝ පැවිදි උතුමන් නොමැතිනම් ගුරුභවතුන්ගේ මැදිහත්වීම මත හෝ ආගමික වතාවත් සිදු කිරීම.
- ආගමික වතාවත් සඳහා යොදාගන්නා පූජා ද්‍රව්‍ය නිසිලෙස පිළියෙල කර නිසිලෙස පිළිගන්වා ආගමික වතාවත්වලින් පසු බැහැර කරන දෑ නිසිලෙස බැහැර කර සියලු උපකරණ පිරිසිදු කර ක්‍රමානුකූලව තැන්පත් කර තැබීම.
- ඒ ඒ ආගම්වලට සුවිශේෂ ආගමික දිනවල දී එහි වැදගත්කම පහදා දී ඒ සඳහා අවශ්‍ය සැරසිලි කිරීම් හා ආගමික වතාවත් සිදු කරන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.
- පාසල තුළ, ආගමික වත්පිළිවෙත් කරනු ලබන වන්දනීය/පූජනීය ස්ථානය පැහැදිලිව දර්ශනය වන පරිදි පිරිසිදු ස්ථානයක පවත්වාගෙන යාම.

## 2.2.4 ආපන ශාලාව

- ආපන ශාලාව ඉතා පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගැනීම. (පරිශ්‍රය, බඳුන්, ආහාර හා අනෙකුත් නියමිත දෑ)
- පාසල් ආපන ශාලාවේ දරුවන්ට අහිතකර රසකාරක, වර්ණකාරක යෙදූ ආහාර හා කෘතිම ආහාර අලෙවි නොකිරීම.
- දරුවන්ට යහපත් ආහාර පුරුදු ඇති කරවන අයුරින් ආහාර ගැනීමට හැකිවන ලෙස ආපන ශාලාව පවත්වාගෙන යාම. (අත් සෝදා ගැනීමට, ඉදගෙන ආහාර ගැනීමට හැකි ලෙස ආසන සැකසීම, කසල බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයට වර්ණ ගැන්වූ බඳුන් තැබීම
- ආහාර දවටන, ඉතිරිවන ආහාර ද්‍රව්‍ය සෞඛ්‍ය ආරක්ෂිත පරිදි බැහැර කිරීම.
- පෝෂ්‍යදායී දේශීය ආහාර අලෙවිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- විවිධ රෝග සහිත හෝ පෞද්ගලික පිරිසිදුතාවෙන් ඌන පුද්ගලයින් ආපන ශාලාවේ කටයුතු සඳහා යොදා නොගැනීම හා සේවකයින් අන් අයට ආචාරශීලීවීම.

- ආපන ශාලා සම්බන්ධ චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කිරීම.
- ආපන ශාලාවේ මිල දර්ශකයක් ඉතා පැහැදිලිව සියලු දෙනාට හොඳින් පෙනෙන සේ දර්ශනය කිරීම.

2.2.5

## විදුහල්පති කාර්යාලය

- පාසල් පරිශ්‍රයේ වැඩි ප්‍රමාණයක් විදුහල්පතිවරයාට නිරීක්ෂණය කළ හැකි ස්ථානයක කාර්යාලය ස්ථාපිත වීම වඩා උචිතය .
- කාර්යාලයේ දෛනික පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා නිසි වැඩපිළිවෙළක් යෙදීම.
- කාර්යාලයේ ගෙබිම, බිත්ති, රාක්ක, විදුහල්පති මේසය, පුටුව ඇතුලු සියලු ස්ථාන ක්‍රමානුකූලව අලංකාරව හා පිරිසිදුව පවත්වාගෙන යාම.
- කාර්යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩල සඳහා ද නිශ්චිත ස්ථාන ක්‍රමානුකූලව හා නාමකරණයක් සහිතව පවත්වා ගැනීම.
- ගුරුවරුන් ඇතුලු කාර්යමණ්ඩලයේ තොරතුරු, ශිෂ්‍ය ඇතුළත්වීමේ ලේඛන, පෞද්ගලික ලිපිගොනු, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අයත් ලේඛන ඇතුළත් සියලු ලිපි ලේඛන සුචිගත කර ක්‍රමානුකූලව සිත්ගන්නා අයුරින් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

2.2.6

## උපදේශන මධ්‍යස්ථානය

- උපදේශන මධ්‍යස්ථානය සඳහා නිදහස් ස්ථානයක් යොදා ගැනීම.
- දරුවාට නිදහසේ අදහස් දැක්විය හැකි වාතාවරණයක් උපදේශන කාමරය තුළ ගොඩනැගීම.
- උපදේශන කාර්යයට මනා පුහුණුවක් ලත් මානව හිතවාදී ගුරු භවතෙකු මේ සඳහා යෙදවීම.
- දරුවන් සම්බන්ධ වාර්තා රහස්‍ය භාවය රැකෙන අයුරින් ආරක්ෂිත ලෙස ගබඩා කිරීමේ පහසුකම් සැපයීම.
- දරුවන් සම්බන්ධ රහස්‍ය වාර්තා අත්‍යවශ්‍ය පුද්ගලයන්ට පමණක් සැපයීම.(අවශ්‍ය පරිදි විදුහල්පතිට දෙමාපියන්ට හෝ දරුවාගේ වෛද්‍යවරයාට...)

## 2.2.7 සනීපාරක්ෂක පහසුකම්

- ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් වැසිකිළි හා කැසිකිළි පහසුකම් ස්ත්‍රී/පුරුෂ ලෙස නම්කර හැකි සෑම විටම ප්‍රාථමික/ද්විතීක/ජ්‍යෙෂ්ඨ ලෙස වෙන්කර පවත්වාගෙන යාම.
- වැසිකිළි හා කැසිකිළි සඳහා අඛණ්ඩ ජල පහසුකම් තිබීම.
- පවිත්‍රතාව පිළිබඳ දිනපතා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් සැකසීම හා නිසි නියාමනයකින් පවත්වාගෙන යාම.

## 2.3 සාරධර්ම ක්‍රියාකාරී කමිටු පිහිටුවීම.

සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහනේ අරමුණු ඉටුවන ආකාරයට ශක්තිමත්ව හා මනා සංවිධානයකින් යුතුව සාරධර්ම කමිටු පිහිටුවිය යුතුය. එහිදී ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය සහ විෂය සමගාමී මෙන්ම විෂය බාහිර කටයුතුවල දී සාරධර්ම ඔප්නැංවෙන අයුරින් විදුහල්පති සහ ගුරුමණ්ඩලයේ සෘජු නියාමනයකින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

### සාරධර්ම ක්‍රියාකාරී කමිටු හා නියාමනය

2.3.1 සාරධර්ම ප්‍රවර්ධන කමිටු ව්‍යුහය.
2.3.2 සාරධර්ම ප්‍රවර්ධන පාසල් ක්‍රියාකාරී කමිටුව.
2.3.3 සාරධර්ම ප්‍රවර්ධන පන්ති ක්‍රියාකාරී කමිටු ව්‍යුහය.
2.3.4 සාරධර්ම ප්‍රවර්ධන ශ්‍රේණි ක්‍රියාකාරී කමිටු ව්‍යුහය.
2.3.5 සාරධර්ම ක්‍රියාකාරී කමිටු නියාමනය

## 2.3.1 සාරධර්ම ප්‍රවර්ධන කමිටු ව්‍යුහය.

පහත සඳහන් ආකාරයට සාරධර්ම ප්‍රවර්ධන කමිටුව නියෝජනය වේ.

**උපදේශකවරුන්**

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා
ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

**සභාපති**

අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්

**සම සභාපති**

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්


**උපසභාපතිවරු**

අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් නම් කරන ලද අතිරේක ලේකම්වරයෙකු
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

**නියෝජිතවරුන්**

අධ්‍යාපන අමාත්‍යංශයේ ආගම් හා සාරධර්ම ශාඛාවේ අධ්‍යක්ෂ හා එහි සියලුම මාණ්ඩලික ශ්‍රේණි නිලධාරීන්,
ජාතික අධ්‍යාපන ආයතනයේ ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුලු සියලුම මාණ්ඩලික ශ්‍රේණි නිලධාරීන්,
පළාත් නියෝජනය කරන පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

# සාරධර්ම ප්‍රවර්ධන කමිටු ව්‍යුහය



## 2.3.2 සාරධර්ම ප්‍රවර්ධන පාසල් ක්‍රියාකාරී කමිටුව.

සභාපති- විදුහල්පති

ලේකම්- පාසල් ක්‍රියාකාරි කමිටු සාමාජික සංයුතිය පහත පරිදි වේ. එම සාමාජිකයන් අතුරින් වඩාත් සුදුස්සෙකු තෝරා පත්කරගත හැකිය.

සාමාජිකයින්- 01. නියෝජ්‍ය/සහකාර විදුහල්පති

02. අංශ ප්‍රධානීන්

03. පූජ්‍ය, පූජක පක්ෂයේ ගුරු භවතුන්

04. ආගම් විෂය භාර ගුරු භවතුන් හෝ ඕනෑම ගුරු භවතෙකු

05. පාසල් සංවර්ධන සමිතියේ ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික ඇතුලු කාරක සභිකයන්

06. ශිෂ්‍ය නායක නායිකාවන් (අංශ නියෝජනය වන පරිදි උපරිමය 8 දෙනෙකු).

ආරාධිතයින්- 01. ආගමික සිද්ධස්ථාන භාර පූජ්‍ය/ පූජක පක්ෂය.

02. පාසලට සුභපතන්නන් අතුරින් ආදර්ශවත්, චරිතවත් දෙදෙනෙක්.

03. පාසලට සම්බන්ධ විවිධ ආයතනවලින් ඉතා සුදුසු පුද්ගලයින් කිහිප දෙනෙක් .(සුදුසු පරිදි සංඛ්‍යාව තෝරාගත හැකිය)

- **සාරධර්ම ප්‍රවර්ධන පාසල් ක්‍රියාකාරී කමිටුවේ කාර්යභාරය**

➢ වාර්ෂික සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් ඇතුළත් පාසල් ලිත පිළියෙළ කිරීම හා එහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

➢ පාසල් පරිසරය සාරධර්ම ප්‍රවර්ධනයට අනුකූල ලෙස සැකසීම.

➢ පාසලේ සියලු මානව සම්පත් සාරධර්මානුකූලව හැඩගැස්වීම.

- **සියලු අධීක්ෂණ කටයුතු**

➢ පාසල් ක්‍රියාකාරී කමිටුව සෑම මසකම අවසන් සතියේ සුදුසු දිනක දී රැස්විය යුතුය.
➢ දරුවන් හා පාසල සම්බන්ධ වී සිදුකරන සියලු කටයුතුවල දී ක්‍රමානුකූලභාවය, පිළිවෙළ, නිරවද්‍යතාව, ඵලදායීතාව, කාර්යක්ෂමතාව, කාල කළමනාකරණය වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකර කටයුතු කිරීම තුළින් දරුවාට සාරධර්මවලින් හෙබි මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමට මග පෙන්වීම.

## 2.3.3 සාරධර්ම ප්‍රවර්ධන පන්ති ක්‍රියාකාරී කමිටු ව්‍යුහය.

සෑම පාසලකම සාරධර්ම කමිටු පිහිටුවිය යුතු අතර එම කමිටු නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යෑමට සියලු දෙනා ම වගවීමෙන් කටයුතු කළ යුතුය. සාරධර්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සාරධර්ම කමිටුවල මෙහෙයවීමෙන් සිදුකිරීමට සංවිධානය විය යුතුය.

සභාපති-. පන්තිභාර ගුරුවරයා

ලේකම් .- ප්‍රාථමික ශ්‍රේණි සඳහා දෙමාපියකු ද අනෙකුත් ශ්‍රේණි

සඳහා සුදුසු ශිෂ්‍යයෙක් ද පත්කර ගත යුතුය.

කාරක සභාව -01. ශිෂ්‍ය නියෝජනය 04(පන්ති නායක/නායිකා, උප

නායක/නායිකා)

02. දෙමාපිය නියෝජනය 10 (මව්වරුන් 05, පියවරුන් 05)

සාමාජික . -අදාළ ශ්‍රේණියේ සියලුම ශිෂ්‍යශිෂ්‍යාවන් හා ඔවුන්ගේ

දෙමාපියන් නිත්‍ය සාමාජිකයෝ වෙති.

- **සාරධර්ම ප්‍රවර්ධන පන්ති ක්‍රියාකාරී කමිටුවේ කාර්යභාරය**

➢ දරුවන් හා ජනජීවිතය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන සියලු කටයුතුවල දී සාරධර්ම සංවර්ධනය වන ආකාරයට කටයුතු කිරීම.
➢ සමාන්තර සෑම පන්තියකටම වෙන වෙනම කමිටු පිහිටුවා ව්‍යාපෘති තුනක්වත් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතුය.
➢ අවශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා ඒවා ඵලදායි ලෙස වගකීමෙන් හා වගවීමෙන් යුතුව ක්‍රියාවට නැංවීම.

**2.3.4 සාරධර්ම ප්‍රවර්ධන ශ්‍රේණි ක්‍රියාකාරී කමිටු ව්‍යුහය.**

සභාපති -. ශ්‍රේණිභාර ගුරුවරයෙකු

ලේකම් .- ප්‍රාථමික ශ්‍රේණි සඳහා දෙමාපියකු ද අනෙකුත් ශ්‍රේණි සඳහා සුදුසු ශිෂ්‍යයෙක් ද පත්කර ගන්න.

කාරක සභාව - 01. ශිෂ්‍ය නියෝජනය 04 (පන්ති නායකනායිකා, උප නායකනායිකා)

02. දෙමාපිය නියෝජනය (මව්වරුන් 05, පියවරුන් 05)

සාමාජික . - අදාළ ශ්‍රේණියේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ඔවුන්ගේ දෙමාපියන් නිත්‍ය සාමාජිකයෝ වෙති.

- **සාරධර්ම ප්‍රවර්ධන ශ්‍රේණි ක්‍රියාකාරී කමිටුවේ කාර්යභාරය**

  - දරුවන් හා ජනජීවිතයට සම්බන්ධ සියලු කටයුතුවල දී සාරධර්ම සංවර්ධනය වන ආකාරයට කටයුතු කිරීම.
  - සමාන්තර සෑම ශ්‍රේණියකටම වෙන වෙන කමිටු පිහිටුවා ව්‍යාපෘති තුනක්වත් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතුය.
  - අවශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා ඒවා ඵලදායි ලෙස වගකීමෙන් හා වගවීමෙන් යුතුව ක්‍රියාවට නැංවීම.

**2.4 පාසල් සාරධර්ම වැඩසටහනෙහි ක්‍රියාකාරකම්**

2.4.1 ආගමික හැදියාව හා ළැදියාව ඇති කිරීමට අදාළ ක්‍රියාකාරකම්

2.4.2 සදාචාරවත් ලෙස චරිත සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්

2.4.3 මානසික ඒකාග්‍රතාවය ඇති කරවීම සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2.4.4 කුසලතා හා විනෝදාංශ

### 2.4.5 යහපත් සමාජ සබඳතා



ආධ්‍යාත්මික ඒකාග්‍රතාව ඇතිකරවීම සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන්



යහපත් සමාජ සබඳතා




කුසලතා හා විනෝදාංශ

පුද්ගලයා



ආගමික හැදියාව හා ළැදියාව ඇතිකරවන වැඩ සටහන් ක්‍රියාවට නැංවීම



සදාචාරවත් ලෙස සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්

පාසල් සාරධර්ම වැඩසටහනෙහි ක්‍රියාකාරකම් සටහන

### 2.4.1. ආගමික හැදියාව හා ළැදියාව ඇති කරවන වැඩසටහන් ක්‍රියාවට නැගීම

I. උදෑසන එකිනෙකා හමුවන අවස්ථාවේ දී තමාගේ ආගමට හා සංස්කෘතියට අනුව ආශිර්වාද කිරීම. (උදා-තෙරුවන් සරණයි, ආයුබෝවන්, Good Morning, ජේසු පිහිටයි, අස්සලාම් අලෙයිකුම්, වනක්කම් ආදී ලෙස).

II. උදෑසන රැස්වීමේ දී තම ආගමට අදාළ දහම් සිතිවිලි හා පණිවිඩ ලබාදීම. ( තම පාසලට අදාළ සංස්කෘතියට අනුව කටයුතු කරන්න)

III. නිරන්තරයෙන් පාසල් භූමිය තුළ ආදර්ශවත් ආගමික වැකි ප්‍රදර්ශනය කිරීම. (බිත්ති පුවත්පත්, දැන්වීම් පුවරු, වැකි ප්‍රකාශ )

IV. පාසල තුළ තම ආගමට අදාළ සමිති සමාගම් පිහිටුවා (සතියකට හෝ මාසයකට වරක්) ක්‍රියාකාරී ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

V. තම ආගමට අදාළ සුවිශේෂ ආගමික දින ප්‍රායෝගිකව සැමරීම (සියලුම ළමයින් සහභාගි කරවා ගැනීම මැනවි)

යෝජනා

I. තම ආගමට අදාළ දහම් පාසලට යන බවට තහවුරු කෙරෙන වැඩ පිළිවෙළක් සකසා නියාමනය කිරීම.

II. පාසල තුළ ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට ගෞරව කරන විවිධ ආචාර ධර්ම ක්‍රියාත්මක කිරීම. (උදා.-ගුරුවරයා පන්තියට පැමිණිවිට හුනස්නෙන් නැගිටීම, ආචාර කිරීම)

### 2.4.2 සදාචාරවත් ලෙස චරිත සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්

- අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැංවීම උදෙසා එකිනෙකාට උදවු උපකාර කිරීමට උනන්දු කරවීම.
- මත්ද්‍රව්‍ය ඇතුලු අනෙකුත් අහිතකර පුරුදුවල අනිටු ප්‍රතිවිපාක අවබෝධ කරගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යොමු කිරීම.
- නායකත්ව ගුණාංග සංවර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම.
- සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියාකාරකම් සංවිධානය කළයුතුය..
- සාරධර්ම කුමර කුමරියන් පත්කරගෙන ක්‍රියාකාරකම්හි යොදවා ඇගයීමට ලක් කිරීම.

- ආගමික වැඩසටහන් පවත්වා යාවජීව ක්‍රියාවලියන්හි යෙදවීම.
- අභියෝග ජය ගැනීම හා පරාජය හමුවේ නොසැලී කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- ආදර්ශවත් ආගමික වැකි ශ්‍රවණයට අවස්ථාව සැලසීම.

### 2.4.3 මානසික ඒකාග්‍රතාව ඇතිකරවීම සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

I. පන්තිකාමරය තුළ සිත එකඟ කරවන මානසික අභ්‍යාසයන්වලට යොමු කිරීම.
II. පාඩම ආරම්භයේ දී ප්‍රවේශයක් ලෙස සිත එකඟ කරවන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
III. පාසල ආරම්භයේ දී හා අවසානයේ දී ගායනා කළයුතු ආගමානුකූල ආශීර්වාදාත්මක ගායනයන්ට අවස්ථාව සැලසීම (ඡත්තමානවක ගාථා ආදීය), සිත එකඟ කරවන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
IV. නිදහස් කාලච්ඡේදවල දී පුස්තකාල භාවිතයට යොමු කිරීම.
V. චරිතාරෝපිත ක්‍රියාකාරකම්හි යෙදවීම. (උදා--.සුළඟක්, ගසක්, එක් චරිතයක් වැනි විචල්‍ය යොදාගෙන අභිරූපණ ඉදිරිපත් කිරීම).

### 2.4.4 කුසලතා හා විනෝදාංශ

I. ක්‍රීඩා කටයුතුවලට දරුවන් යොමු කිරීම.
II. සෞන්දර්ය කුසලතා සංවර්ධනය කරගත හැකි කලා ප්‍රසංග පැවැත්වීම.
III. උදෑසන, විවේකකාලයේ දී හෝ පාසල අවසන්වන අවස්ථාවල දී අර්ථාන්විත සෞන්දර්ය රසයෙන් යුතු ගීත ප්‍රචාරය කිරීම.
IV. නවගීත, කවි, කථා. කාව්‍ය යනාදී නිර්මාණ කුසලතා සංවර්ධනයට අවස්ථා ලබාදීම.

### 2.4.5. යහපත් සමාජ සබඳතා

- ළමා නිවාස, වැඩිහිටි නිවාස, රෝහල්, ආගමික සිද්ධස්ථාන යනා දී ආයතන ආශ්‍රිතව සුවිශේෂී වැඩසටහන් සුදුසු පරිදි සකස් කර ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙසෙන ආයතනවලට උදවු උපකාර කිරීම.
- පැවිදි උතුමන් සමඟ කථාබස් කිරීමේ දී ගරුබුහුමන් සහිතව කටයුතු කිරීම.
- පාසල අවට ඇති රාජ්‍ය, පෞද්ගලික ආයතන හා නිවෙස්වලට හිරිහැරයක් නොවන පරිදි හැසිරීමට හුරුකිරීම.

## 3.0 දෙමාපියන් දැනුවත් කිරීම සඳහා ගුරුවරයාගේ මග පෙන්වීම

3.1 දැනුවත් කිරීම හා සංවිධාන කටයුතු පැහැදිලි කරන්න.
3.2 නිවස තුළ දී අන්‍යෝන්‍ය අවබෝධයෙන් කටයුතු කිරීමට දරුවන් සමග කටයුතු සිදුකළයුතු ආකාරය පිළිබඳව මග පෙන්වන්න.
3.3 සෑම අවස්ථාවකදීම දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ විශේෂ අවධානයක් දක්විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.
3.4 නිවස තුළ ඉගෙනුම් පරිසරයක් ඇති කරගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.
3.5 සමාජ සංහිඳියාව ඇතිකිරීම සඳහා දරුවා යොමු කළ යුත්තේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

### 3.1 දැනුවත් කිරීම හා සංවිධාන කටයුතු

- විදුහල්පතිගේ මෙහෙයවීම යටතේ සියලු අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලය සමග මෙය සුවිශේෂ වැඩසටහනක් ලෙස වසරකට වරක් වර්ෂය මුල දී ආරම්භ කළ යුතුය.

- මෙම දැනුවත් කිරීම සඳහා ප්‍රදේශයේ පූජ්‍ය/පූජක පක්ෂය, පොලිස් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, මත්ද්‍රව්‍ය නිවාරණ අංශයේ නිලධාරීන් හ පාසලට සුභපතන්නන් සහභාගි කර ගත යුතුය.

### 3.2 දෙමාපියන් දරුවන්ගේ සාරධර්ම ප්‍රවර්ධනය උදෙසා නිවස තුළ දී කටයුතු කළ යුත්තේ කෙසේ ද?

- දරුවන් සමඟ අන්‍යෝන්‍ය සුහදශීලී භාවයෙන් සෑම දරුවකුටම එක සමානව සැලකිය යුතුය.

- පවුලේ සමගිය ආරක්ෂා කරමින් දරුවන්ගේ අභිමානය රැකෙන අයුරින් සෑම මොහොතේම කටයුතු කළ යුතුය.

- දවසේ වෙන්කර ගත් වැඩිපුර කාලයක් දරුවන් සමඟ ගතකිරීමට යොදා ගතයුතුය.

- රාත්‍රී ආහාරය නිවසේ සියල්ලෝ එක්ව ගත යුතුය.

- නිවස තුළ සිදුකෙරෙණ දෛනික කටයුතුවලට දරුවන් සහභාගි කරගත යුතුය. (උදා:- වතාවත්, පිරිසිදු කිරීම්)

- සියල්ලන්ට එකට සිට රසවිඳිය හැකි සුදුසු රූපවාහිනී වැඩසටහන් වෙත නැඹුරු කරවීම. (දේශීය සංස්කෘතිය අගයන දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට බෙහෙවින් ඉවහල්වන වැඩ සටහන්)

- පාසල නිමවී නිවස තුළට පැමිණි පසු දෛනිකව භාවිත කළ දෑ (ඇඳුම්/සපත්තු/මේස්) හා පොත් බෑගය මෙන්ම අනිකුත් දෑ නිසි පිළිවෙලට නිසි පරිදි තැබීමට හා එදිනට නියමිත අධ්‍යයන කටයුතු සුළු විවේකයකින් පසු නිම කිරීමට පුරුදු පුහුණු කිරීම.

- පසු දිනට පාසල් යෑමට සූදානම් වීම සඳහා පන්ති කාලසටහනට අනුව පොත්පත්  සහ අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය සූදානම් කරවීමට පුරුදු පුහුණු කිරීම.

- ගෘහස්ථ හිංසනය පිටුදැකිය යුතුය.

- පිළිවෙළකට හා විධිමත්ව නිවසේ භාණ්ඩ නිසි තැන ස්ථානගත කිරීම හා යමක් පරිහරණයෙන් පසු නැවත නිසි පරිදි නිසි තැන තැබිය යුතු බව අවධාරණය කිරීම.

## 3.3. දරුවන්ගේ ආරක්ෂාව පිණිස කටයුතු කළ යුත්තේ කෙසේ ද?

- සම වයස් කණ්ඩායම් ඇසුරට දරුවන් යොමු කිරීම කළ යුතු අතර ඇසුරු කරන්නන් පිළිබඳව විමසිලිමත් විය යුතුය.

- පිරිසිදුව හා ගුණාත්මක භාවයෙන් යුතුව ආහාරපාන පිළියෙල කරදීමට කටයුතු කළ යුතුය.
- සභ්‍යත්වය රැකෙන පරිදි සදාචාරයට ගැළපෙන ඇඳුම් පැළඳුම් ඇඳීමට දරුවන් යොමු කළයුතුය.

- නිවසේ ඇති විදුලි මෙවලම්, උපාංග අරපිරිමැස්මෙන් හා ආරක්ෂිතව භාවිතයට හුරුකිරීම.

- නිවාස, පාසල හා පරිසරය තුළ ඇති අනාරක්ෂිත ස්ථාන හා අවස්ථා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීමට හුරුකිරීම.

- නිවසට පැමිණෙන ඥාති, හිතමිත්‍රාදීන් හා අමුත්තන් සමඟ සුහදශීලීව මෙන්ම ආචාරශීලීව කටයුතු කිරීමට හුරුකිරීම.

## 3.4. නිවස තුළ ඉගෙනුම් පරිසරයක් ඇතිවන සේ කටයුතු කළ යුතු ආකාරය

- විධිමත් සැලසුමකට අනුව අධ්‍යයන කටයුතු කිරීමට දරුවා යොමුකළ යුතුය.

- දරුවන් සමග පොතපත බැලීම, පුවත්පත් කියවීම, කථාන්දර කියවීම හෝ පාඩම් පොතපත කියවීමට දෙමාපියන් පෙළඹවිය යුතු අතර ඒ අනුව දරුවා ද පොතපතට යොමු කිරීමට උපක්‍රමශීලිව කටයුතු කිරීමට උපදෙස් දිය යුතුය.

- පවුලේ සියලුදෙනා එක්ව බුද්ධිවර්ධනයට ඉවහල්වන යහපත් ක්‍රීඩාවක හෝ විනෝදාංශයක නිරතවීම.

- නූතන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතයෙන් අධ්‍යාපන වැඩසටහන් හෝ ළමා වැඩසටහන් වෙත දරුවා යොමු කළයුතුය.

## 3.5. සමාජ සංහිදියාව වර්ධනය වන අයුරින් කටයුතු කළ යුතු ආකාරය.

- ආගමික උත්සව සැමරීමේ දී ආගම්වලට අයත් උත්සව සඳහා සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගී කරවා ගැනීම.
- ජාතික උත්සව වැනි අවස්ථා අර්ථාන්විත අයුරින් සැමරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමුකිරීම.
- සෑම ආගමක්ම නියෝජනයවන පරිදි පූජක උතුමන්ලා කැඳවා ගනිමින් විවිධ ආගමික උත්සව පැවැත්වීමට ශිෂ්‍යශිෂ්‍යාවන් යොමුකිරීම.

## 4.0 නියාමන ආකෘති පත්‍ර

පාසල් පිරියත ඇගයීම්

පාසලේ නම :- ..........................................................................................

ලිපිනය :- ..........................................................................................

දිනය :- .......................................................

උපදෙස්:

පාසල් සාරධර්ම කමිටු විසින් පාසල් වාරයකට වරක් මෙම ඇගයීම් වාර්තාව අනුව ලකුණු පිරිනැමිය යුතු වේ. (අදාළ ලකුණු කොටුවේ හරි(√) ලකුණ යොදන්න)
සෑම ඇගයීම් දර්ශකයක් පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු අතර දෛනික නිරීක්ෂණ ක්‍රියාවලිය හා ඇගයීම් ඔස්සේ උපරිම ලකුණු ලැබෙන ආකාරය අදාළ පාසල් පිරියත සකස් කිරීමට වගබලාගත යුතු වේ.
පාසල් පිරියත නිසිපරිදි පවත්වා ගැනීම පිළිබඳ වගකිවයුතු කණ්ඩායමක් සිටිය යුතුවේ(උදා : ක්‍රීඩාපිටිය පිළිබඳ වගකීම් ගත් කණ්ඩායමක්... ආදී)

1. සැලැස්මකට අනුව පාසලේ සියලු ස්ථාන දිනපතා පිරිසිදු කරයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

2. සියලුම උපකරණ නිශ්චිත ස්ථානවල ස්ථානගත කර ඇත.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

3. පාසලට පිවිසෙන විටම පාසලේ අභිමානය හඳුනාගත හැකි පරිදි පිවිසුම සකසා ඇත.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

4. දෛනික ආගමික වතාවත් සිදුකිරීම සඳහා ස්ථානයක් පිරිසිදු ව ක්‍රමානුකූලව පවත්වා ගනු ලබයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

5. පන්තිකාමරය සිත් ඇදගන්නා අයුරින් ක්‍රමානුකූලව කළමනාකරණය කර තිබේ.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

6. පාසල් භූමිය සංරක්ෂණය ජලය හා කසළ කළමනාකරණය හොඳින් සිදු වේ.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

7. විදුහල්පති කාර්යාලය සිත් ඇදගන්නා අයුරින් ක්‍රමානුකූලව පවත්වාගෙන යනු ලබයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

8. පාසලේ සියලුම ස්ථාන එම කාර්යයන්ට යෝග්‍ය පරිදි ක්‍රමානුකූලව සිත් ඇදගන්නා අයුරින් පවත්වාගෙන යනු ලබයි.(ක්‍රීඩා පිටිය, විද්‍යාගාරය, ආපන ශාලාව... ආදී).

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

9. පාසලේ ප්‍රදර්ශනය කරන සියලු පුවරු විධිමත්ව හා යාවත්කාලීන කර ප්‍රදර්ශනය කරනු ලබයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

10. වැසිකිළි කැසිකිළි පද්ධතිය දිනකට කිහිප වතාවක් බැගින් ක්‍රමානුකූලව පිරිසිදු කරනු ලබයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

11. විදුහල්පති, ගුරුභවතුන්, දරුවන් හා දෙමව්පියන් අන්‍යෝන්‍ය සුහදතාවෙන් හා සතුටින් කටයුතු කරන පරිසරයක් ගොඩනගා ඇත.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

ලකුණු ලබා දීමේ නිර්ණායක

| | |
|---|---|
| ඉතා හොඳයි | ලකුණු - 04 |
| හොඳයි | ලකුණු 03 |
| සතුටුදායකයි | ලකුණු - 02 |
| සංවර්ධනය විය යුතුයි | ලකුණු - 01 |

..............................................

අත්සන
පාසල් සාරධර්ම
කමිටු ලේකම්.

(උපරිම ලකුණු 44යි)

## 5.0 නියාමන ආකෘති පත්‍ර

**විදුහල්පති, ගුරුමණ්ඩලය හා කාර්ය මණ්ඩලය ඇගයීම.**

(ස්වයං ඇගයීම් පත්‍රිකාව)

නම :-.......................................................................................................

තනතුර :-...................................................................................................

දිනය :-..................................................

උපදෙස් :-

කාර්ය මණ්ඩලයේ සියලු දෙනා මෙම කාර්ය පත්‍රිකාව සෑම පාසල් වාරයක ම දෙවන මස මුල් සතියේ (වසරකට 3 වරක්) සම්පූර්ණ කර (අදාළ කොටුවේ හරි(√) ලකුණු යොදා) පාසල් සාරධර්ම ප්‍රවර්ධන කමිටුවේ ලේකම් වෙත භාරදිය යුතුයි.

යම් පසුබෑමක් දක්නට ලැබෙන පුද්ගලයින්ගේ ගැටලු තත්ත්වයන් අවබෝධ කරගැනීමට විදුහල්පති ඇතලු කමිටු ක්‍රියාත්මක විය යුතු අතර එවැනි කාර්ය මණ්ඩල සාමාජිකයින් සදහා විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

ස්වයං ඇගයීම් වාර්තා පිළිබඳව පාසල් සාරධර්ම ප්‍රවර්ධන කමිටුව සෑහීමකට පත්විය යුතුය.

1. පෞද්ගලික පවිත්‍රතාවෙන් හා ප්‍රසන්නතාවෙන් යුක්තව තම තනතුරට උචිත පරිදි සංවරශීලී ඇඳුම් පැළඳුම් භාවිත කරමි/නිල ඇඳුම් භාවිත කරමි.

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

2. නිසි වේලාවට වැඩ කරමින් කාලය කළමනාකරණය කරමි.

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

3. සියලු කටයුතු ඵලදායි හා කාර්යක්ෂම ලෙස කිරීම තුළින් දරුවන්ට ආදර්ශවත්ව කටයුතු කරමි.

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

4. ඉවසීම, කරුණාව, මිත්‍රත්වය, නොපසුබස්නා උත්සාහය වැනි මානුෂීය ගුණාංග පිළිබිඹු වන අයුරින් සෑම අවස්ථාවකම කටයුතු කරමි.

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

5. යහපුරුදු පිළිපදිමින් දරුවන්ට ආදර්ශ සපයමි. (ආහාර පුරුදු, සංවරශීලී කතාබහක පුරුදු, ඉගෙනුම්, ඉගැන්වීම් පුරුදු, ආගමික පුරුදු, සෞඛ්‍ය පුරුදු)

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

6. සදාචාර සම්පන්නව කටයුතු කරමි.(චරිතවත් බව, විවිධ හිතකර ඇබ්බැහිවීම්වලින් වැලකීම, දුම්බීම, මද්‍යසාර භාවිතය, බුලත්විට හැපීම ආදියෙන් වැලකීම)

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

7. ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා නිරන්තර කැපවීමෙන් කටයුතු කරමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

8. සියලු දරුවන්ට දෙමාපිය සෙනෙහසින් යුතුව කටයුතු කරමි. (ළමා හිංසනය, ළමා අපචාරවලට යොමු කිරීම, ළමා අපයෝජන ආදියෙන් වැළකීමෙන් හා අන් අය වළකාලමින්)

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

9. ශිෂ්‍යයන්ගේ හා අධ්‍යාපන කටයුතුවල දී විෂය සමගාමී කටයුතුවල දී මෙන්ම අවශ්‍ය සෑම විටකදීම ඔවුන්ට මගපෙන්වීම, දිරිගැන්වීම හා සහායවීම කරමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

10. විදුහල්පති, ගුරුභවතුන්, අනෙකුත් කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන් සහ දෙමව්පියන් සමඟ සහයෝගයෙන් ඔවුන්ගේ අපේක්ෂා උපරිම මට්ටමින් ඉටු කර දෙමින් පාසල උසස් මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය උපරිම සහාය ලබාදෙමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

ලකුණු ලබා දීමේ නිර්ණායක

ඉතා හොඳයි ලකුණු - 04
හොඳයි ලකුණු - 03
සතුටුදායකයි ලකුණු - 02
සංවර්ධනය විය යුතුයි ලකුණු - 01

..............................................
අත්සන

(උපරිම ලකුණු 40යි)

## 6.0 නියාමන ආකෘති පත්‍ර

ශිෂ්‍ය සාරධර්ම ඇගයීම්
(ස්වයං ඇගයීම් පත්‍රිකාව)
ශිෂ්‍යයාගේ නම :-.......................................................................................
ශ්‍රේණිය :-.......................................................................................
වර්ෂය :-..............................................................
වාරය :-..............................................................

| |
|---|
| උපදෙස් :-<br>සියලුම සිසුන් (ප්‍රාථමික ශ්‍රේණි හැර)විසින් මෙම ස්වයං ඇගයීම් පත්‍රිකාව පාසල් වාරයකට එක්වරක් බැගින් සම්පූර්ණ කර අදාළ ශ්‍රේණි භාර ගුරුභවතා වෙත ලබාදිය යුතුය.<br><br>ක්‍රියාකාරී සාරධර්ම පන්ති කමිටුව මෙම පත්‍රිකා නිරීක්ෂණය කර ඇගයීම් සම්බන්ධ සැහීමකට පත්විය යුතුය.<br><br>පන්තිභාර ගුරුභවතාගේ විශේෂ අධීක්ෂණය මගින් අදාළ නිර්ණායක සාක්ෂාත් කර නොගන්නා සිසුන්ගේ සංවර්ධනයට විශේෂ ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

1. මම දිනපතා පිරිසිදුව, ප්‍රසන්නව පාසල් නිල ඇඳුමින් සැරසී පාසලට පැමිණෙමි. | 1 | 2 | 3 | 4 |

2. පොත්පත් ඇතුලු පරිහරණය කරන සියලුම උපකරණ පිළිවෙළට පිරිසුදුව, ඵලදායි ආකාරයට භාවිත කරමි. මගේ සොයුරු සොයුරියන් සඳහා ඒවා ආරක්ෂා කරමි. | 1 | 2 | 3 | 4 |

3. උදේ සවස ආගමික වතාවත්වල යෙදෙමි. දෙමව්පියන්ට ගුරුවරුන්ට කීකරුව, ගෞරවාන්විතව හැසිරෙමි. | 1 | 2 | 3 | 4 |

4. පාසල ආරම්භයට පෙර පාසලට පැමිණ පිරිසිදු කිරීම් කටයුතුවලට සහාය දෙමි. | 1 | 2 | 3 | 4 |

5. නිවැරදි ඉරියව් සහ පිළිවෙත් පවත්වා ගැනීම සහ (සිටගැනීම, වාඩිවීම, කතාබහ, ආහාර පුරුදු, හැසිරීම් පුරුදු) බුදු සරණයි! ස්තුතියි, දෙවිපිහිටයි! යන වචන අවස්ථානුකූලව භාවිත කරමි. | 1 | 2 | 3 | 4 |

6. ඉරිදා දින දහම් පාසලේ අධ්‍යාපනය ලබමි. ආගමානුකූලව හැසිරෙමි. | 1 | 2 | 3 | 4 |

7. පාසල තුළ දී හා ඉන් බාහිරව පාසලට ගෞරවය ලැබෙන පරිදි කටයුතු කරමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

8. නිරතුරුව ක්‍රියාශීලී, ප්‍රියමනාප, සුහදශීලි සහ විනයගරුක හැසිරීමෙන් යුක්ත වෙමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

9. සහෝදර සිසුන්ට යහපත් කාර්යන්හි දී උදව් කරමින් අයහපත් කාර්යයන්හි දී ඔවුන් එයින් මුදවා ගැනීමට කටයුතු කරමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

10. පාසලේ දී හා ඉන් බාහිරව අධ්‍යයන කටයුතු හා විෂය බාහිර කටයුතු ඉතා උනන්දුවෙන් කරමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

11. කිසිදු අවස්ථාවක අන්අයගේ සිත් රිදෙන ආකාරයට කතා නොකරමි. අන් අයට නිග්‍රහ නොකරමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

12. පාසල තුළ දී හෝ ඉන් බාහිරව හෝ මත්වතුර, මත්ද්‍රව්‍ය භාවිත නොකරන අතර අන්කෙනෙකු ඒවා භාවිත කරන්නේ නම් ඒවාට අනුබල නොදෙමි. එයින් මුදවමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

ලකුණු ලබා දීමේ නිර්ණායක

ඉතා හොඳයි ලකුණු - 04

හොඳයි ලකුණු - 03

සතුටුදායකයි ලකුණු - 02

සංවර්ධනය විය යුතුයි ලකුණු - 01 (උපරිම ලකුණු 48යි)

ශිෂ්‍යයාගේ අත්සන :-.............................................

පන්ති භාර ගුරුවරයාගේ නම :-......................................................................

අත්සන :-.............................................

**පන්තිභාර ගුරුභවතාගේ නිර්දේශය :-**

මෙම ශිෂ්‍යයාගේ සාරධර්ම සාධනය ඉතා හොඳයි/හොඳයි/තවදුරටත් සංවර්ධනය විය යුතුයි. (මේ සඳහා ඔබගේ නිරීක්ෂණ සැලකිල්ලට ගන්න)

**පාසල් සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන නියාමන ක්‍රියාවලිය :-**

**කොට්ඨාස මට්ටම**

කොට්ඨාස භාර නිගඅගඅා/ සගඅගඅ

ගුරු උපදේශක (ආගමික සාරධර්ම)

**කලාප මට්ටම**

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප ගුරු උපදේශකවරුන්
(එක් කොට්ඨාසයකට එක් අයකු බැගින්)

**පළාත් මට්ටම**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ බලය පවරනු ලබන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
පළාත් ගුරු උපදේශකවරුන්

**අමාත්‍යාංශ මට්ටම**

අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම)
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම)
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු මාණ්ඩලික නිලධාරීන්

**නියාමන ක්‍රියාවලිය**

කොට්ඨාසයට අයත් සියලුම පාසල් වාර්ෂික සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහනේ පිටපත් වාර්ෂික ලිත හා සාරධර්ම පන්ති කමිටු මගින් ක්‍රියාත්මක කරනු ලබන සාරධර්ම වැඩසටහන් පිටපතක් ගෙන්වා ගැනීම.
කොට්ඨාසයේ සියලු පාසල්වල ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශ ගත පිටපතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවීම.
කොට්ඨාස වැඩසටහන්වලට අදාළ ක්‍රියාකාරකම් නිරීක්ෂණ/අධීක්ෂණ සඳහා පත්කරන ලද නිලධාරීන් මාසික සැලසුම්සහගත වැඩසටහනට අනුකූලව පාසල්වලට යැවීම.
එම නිලධාරීන් අදාළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය/අධීක්ෂණය සඳහා පත්කරන ලද නිලධාරීන් අදාළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර ප්‍රගති වාර්තා කිරීම හා අවශ්‍ය පරිදි පාසලට සහය දැක්වීම.